# කළමනාකරණ කමිටු රැස්වීම

දිනය - 2022.11.24

වෙලාව - ප.ව 2.00

ස්ථානය - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප)

මූලාසනය - ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මහත්මිය (ප්‍රධාන ලේකම්)

සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

1. ඩබ්ලිව්.ටී.ජේ.මානෙල් මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
2. ජේ.එම්.එස්.මල්කාන්ති මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)
3. කේ.ජේ.ඩී.කේ.සිරිවර්ධන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)
4. ජී.ඩබ්ලිව්.පී.පෙරේරා මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
5. කේ.ජී.එස්.ප්‍රසන්න මයා - ප්‍රධාන අභ්‍යන්තර විගණක
6. කේ.එන්.කේ.සිල්වා මිය - ආදායම් කොමසාරිස් (බ.ප)
7. පාලිත අබේවර්ධන මයා - ප්‍රධාන නීති නිලධාරී, නීති ඒකකය
8. ඩබ්ලිව්.ජේ.සී.එස්.ප්‍රියදර්ශනී මිය - අධ්‍යක්ෂ ( ආදායම්)
9. කේ.ජී.සුදර්ම සිසිර කුමාර මයා - අධ්‍යක්ෂ (සැලසුම්)
10. ආර්.පී ගුණවර්ධන මිය - අධ්‍යක්ෂ (ගොඩනැගිලි)
11. එන්.එච්.සුමින්ද මයා - අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)
12. ආශා පනාගොඩ මිය - අධ්‍යක්ෂ(ඉංජිනේරු)
13. ඒ.තලංගම මයා - මූලස්ථාන ඉංජිනේරු
14. කේ.එන්.සූරියආරච්චි මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)
15. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරී (ඉංජිනේරු)

ප්‍රධාන ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පැවති කළමනාකරණ කමිටු රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනවල දීර්ඝ කාලයක් සේවය කළ නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධව | පළාත් පාලන ආයතනවල ඇතැම් නිලධාරින් ප්‍රධාන කාර්යාලය හා උප කාර්යාල අතර දිගු සේවා කාලයක් සේවය කිරීම, සංවර්ධන නිලධාරි හා කළමනාකරණ සේවා නිලධාරින්ගේ ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් වෙත පවරා ඇති බලතල ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත පවරා දීමට කටයුතු කරන ලෙස පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැනුම් දීමට කටයුතු කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) විසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු ) |
| 02. | ආහාර හා පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | සියළුම අමාත්‍යාංශ වලින් තොරතුරු ලබාගෙන ආහාර හා පෝෂණය සම්බන්ධ සැලසුම් සකස් කර ඇති බවත්, 2022.11.29 දින පැවැත්වෙන ආහාර සුරක්ෂිතතා රැස්වීමට එය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැලසුම්) හා සැලසුම් අධ්‍යක්ෂ විසින් කරුණු දක්වන ලදී.<br>ඒ අනුව බස්නාහිර පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල සැලසුම් අනුව සකස් කරන ලද ඒකාබද්ධ පෝෂණ සැලැස්ම රැස්වීමට ඉදිරිපත් කර 2023 වසරට අදාළ ආහාර හා පෝෂණ සැලසුම් හා 2022 වසරට අදාළ ප්‍රගතිය සාකච්ඡා කරන ලෙසත්, කෘෂිකර්ම අමාත්‍යාංශයට හා දෙපාර්තමේන්තුවට මේ සඳහා පැවරෙන වගකීම් පිළිබඳ දැනුවත් කර ඔවුන්ගේ වගකීම ඉටු කිරීම කෙරෙහි පසු විපරම් කිරීමට කටයුතු ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| 03. | පළාත් සභා ආයතනවලට අයත් වෘත්තීය සමිති හා අනෙකුත් සුභ සාධක ආයතන සඳහා ශ්‍රවණාගාරය ලබා දීම | පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වලට අයත් වන වෘත්තීය සමිති හා අනෙකුත් සේවක සුභ සාධක ආයතනවලින් නිතර පළාත් සභා ශ්‍රවණාගාරය යම් යම් රැස්වීම්, සම්මේලන සඳහා ඉල්ලුම් කරනු ලබයි. මෙම ශ්‍රවණාගාරය පළාත් සභාවට අයත් අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන සඳහා නොමිලේ ලබා දෙන නමුත් බාහිර ආයතනවලට ලබා දීමේදී යම් නියම කරන ලද මුදලක් අයකිරීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව මෙම වෘත්තීය සමිති හා අනිකුත් සේවක සුභ සාධක ආයතන පළාත් සභා ආයතනයන් නොවන බැවින් ශ්‍රවණාගාරය ලබා දීමේදී ඒ සඳහා මුදලක් අයකිරීමට කටයුතු කිරීම සුදුසු බව සාකච්ඡා කරන ලදී.<br><br>ඒ අනුව එම ආයතන පළාත් සභා ආයතන නොවන නමුත් පළාත් සභාවට අයත් අමාත්‍යාංශ ,දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගේ සේවක සුභ සාධක සංගම් වන බැවින් ඔවුන්ගෙන් දැනට අනෙකුත් ආයතන සඳහා නියම කර ඇති මුදල අය නොකර ශ්‍රවණාගාරය ලබා දෙන කාල සීමාවට අදාළ වන පරිදි ජලය, විදුලිය හා ඔවුන් වෙත ලබා දෙන අනිකුත් සේවාවන් සඳහා පළාත් සභාවට වැයවන යම් මුදලක් තක්සේරු කර ඒ සඳහා යන මුදල අයකර ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) |
| 04. | වර්ෂය අවසාන කටයුතු සඳහා නිවාඩු දින රාජකාරි කටයුතුවල නිරතවීම සම්බන්ධව | වර්ෂ අවසානයේ ගිණුම් පියවීම හා අත්‍යවශ්‍ය රාජකාරි කටයුතු සඳහා නිවාඩු දිනයන්හි සේවය කිරීම සම්බන්ධව සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනිකුත් ආයතන වලින් ඉල්ලීම් ඉදිරිපත් වන අතර, ඒ සඳහා පොදු තීරණයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය සම්බන්ධව සාකච්ඡා කරන ලදී.<br>ඒ අනුව වර්ෂ අවසානයේ ගිණුම් පියවීම හා අත්‍යාවශ්‍ය රාජකාරී සිදු කිරීම සඳහා අවශ්‍යතාවයන් හඳුනාගෙන නිවාඩු දිනයන්හි අතිකාල සේවය කිරීමට ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කරන ලෙස පොදුවේ සියළුම අමාත්‍යාංශ ලේකම් වරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 05. | කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් සම්බන්ධව | 2022 වර්ෂයේ අයවැය සම්මත වීමෙන් පසුව නව බඳු ක්‍රම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීමට සාකච්ඡා කර ඇති අතර, ලබන වසර ආරම්භයේ සිට කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් සකස් කරමින් පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු) විසින් ප්‍රකාශ කරන ලදී. | යෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු ) |
| 06. | නිලධාරින්ගේ රාජකාරි කටයුතු ඉටු කිරීම සම්බන්ධව | අමාත්‍යාංශ ලේකම්වරුන්, ආයතන ප්‍රධානීන් කොතෙක් දැනුවත් කළද රාජකාරි කටයුතු පිළිබඳ පවතින වගකීම සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි බව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. එම නිලධාරින්ගේ කාර්යාල තුළ රැඳී සිටීම හා රාජකාරි ඉටු කිරීම මෙන්ම දැනුම් දෙන තොරතුරු පහළ අංශ කෙරෙහි සම්ප්‍රේෂණය වීමේ විධිමත් භාවයක් නොමැති බවත් වැඩි දුරටත් අවධාරණය කරන ලදී.<br>තවද ලිපි වලට පිළිතුරු සැපයීම හා මහජන පෙත්සම් කාරක සභාව හා ගිණුම් කාරක සභාව මඟින් විමසන තොරතුරු ලබා දීමේ ප්‍රමාදයන් තව දුරටත් දක්නට ලැබෙන අතරම එම කාරක සභාවන්ට සහභාගි වීමේදී අදාළ කරුණු පිළිබඳ අවබෝධයක් ලබාගෙන, අදාළ තොරතුරුද සමඟ පූර්ව සූදානමකින් සහභාගි වන ලෙසට සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත ලිඛිතව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් සහකාර ප්‍රධාන ලේකම්(පාලන) දැනුවත් කරන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

| | | | |
|---|---|---|---|
| 07. | බස්නාහිර පළාත් සහා ගොඩනැගිලි පරිශ්‍රයෙහි නාගරික කෘෂිකර්ම ආදර්ශයක් ඇති කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයෙහි නාගරික කෘෂිකර්ම ආදර්ශයක් ඇති කිරීම සඳහා කෘෂි කර්ම අමාත්‍යාංශය මගින් ඉදිරිපත්කර ඇති සැලැස්ම සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී.<br>ඒ අනුව බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයෙහි එසේ පළතුරු හා එළවළු වගාවක් ඇති කිරීම ඉතා සුදුසු බවට කරුණු සාකච්ඡා කළ අතර ගැළපෙන පරිදි එළවළු හා පළතුරු වගාවක් සිදු කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත උපදෙස් ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 08. | අමාත්‍යාංශ මට්ටමින් වර්ෂය තුළ සිදු කර අවසන් කරන ලද ව්‍යාපෘති සම්බන්ධව | වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශ මගින් සිදුකරන ලද ව්‍යාපෘති සම්බන්ධ ප්‍රගතිය පිළිබඳ ප්‍රධාන ලේකම් විසින් විමසන ලදී.<br>ව්‍යාපෘති සිදුකිරීම සම්බන්ධව 90%ක ප්‍රගතියක් පවතින බවත්, වාරිමාර්ග කටයුතු සම්බන්ධයෙන් ගැටළුවක් පැවති නමුත් එම කටයුතුද සිදු කරමින් පවතින බැවින් ගැටළුවක් පැන නොනගින බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) ප්‍රකාශ කරන ලදී.<br>තවද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, පළාත් සංවර්ධන ප්‍රදාන, සෞඛ්‍ය අංශ සංවර්ධන වැය, අධ්‍යාපනික නවීකරණ ව්‍යාපෘති ආදිය මගින් 2022 වසරට ලැබුණු ප්‍රතිපාදන වැය කිරීම හා 2023 වසරට ප්‍රතිපාදන ලැබීම සම්බන්ධව කරුණු සාකච්ඡා කරන ලදී.<br>අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති යටතේ පාසැල්වලට ලබා දෙන ප්‍රතිපාදන වලින් සිසුන්ට ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධව විදුහල්පතිවරුන් ලබා දෙන තොරතුරු වලට අමතරව එම කටයුතු සත්‍ය වශයෙන්ම සිදුවනවාද යන්න සම්බන්ධව පසු විපරමක් දක්නට නොලැබෙන අතර, ඒ සම්බන්ධව අභ්‍යන්තර විගණන අංශය සමඟ ඒකාබද්ධ වී වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී.<br>තවද නව ඉදි කිරීම් සිදු කිරීමට කටයුතු නොකරන ලෙසත්, අත්‍යවශ්‍යම නඩත්තු කටයුතු පමණක් සිදු කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් අවධාරණය කරන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන |

| | | | |
|---|---|---|---|
| 09. | 2023 වසර සඳහා අමතුම් දිනපොත හා දින දර්ශන ලබා දීම සම්බන්ධව | 2023 වසර සඳහා අවශ්‍ය ඇමතුම් දිනපොත හා දින දර්ශන මෙවර රජයේ මුද්‍රණාලය මඟින් මුද්‍රණය නොකරන බවට දැනුම් දී ඇති අතර, ආයතන සඳහා ඒවා ලබා ගැනීමේ අවශ්‍යතාවය හා එය මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කරන ලදී.<br>රජයේ වියදම් කළමනාකරණය යටතේ මේ අවස්ථාවේ ඇමතුම් දිනපොත් මුද්‍රණය සිදු නොකිරිමට හා ඒ වෙනුවට Google Format එකක් සකස් කිරීම සුදුසු බව තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) |

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත